සමාගමේ පසුබිම

ආයතනයේ නම	: සී/ස නිපුණතා සංවර්ධන අරමුදල
තත්ත්වය	: පූර්ණ රජය සතු සමාගමකි
අමාත්‍යාංශය	: මුදල් අමාත්‍යාංශය
ලිපිනය	: 354 / 2 7 වන මහල "නිපුණතා පියස," ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05.
වෙබ් අඩවිය	: www.skillsdevelop.lk
විද්‍යුත් තැපැල් ලිපිනය	: info@skillsdevelop.lk
දුරකථනය	: 011 -2507274
ෆැක්ස්	: 011-2055601
බැංකු	: ලංකා බැංකුව : මහජන බැංකුව

දැක්ම මෙහෙවර සහ අරමුණු

තේමාව

මිනිසුන් සංවර්ධනය තුළින් අතිවිශිෂ්ඨත්වය සහ සාර්ථකත්වය

දැක්ම

නිපුණතා සංවර්ධනයෙහි ජාතික නායකත්වය

මෙහෙවර

නිපුණතා සංවර්ධනය තුළින් ව්‍යවසාය තරඟකාරීත්වය උද්දීපනය කිරීම.

ප්‍රධාන අරමුණු

සී / ස නිපුණතා සංවර්ධන අරමුදලේ සමාගම් පනතේ සකස් කර ඇති පරිදි ප්‍රධාන අරමුණු වනුයේ :

- රැකියා ප්‍රවේශ පුහුණුව සඳහා සහයෝගය දීම, සේවකයන්ගේ නිපුණතා ඉහළ නැංවීම සහ නැවත පුහුණුව
- ඉහළ පුහුණුවෙන් යුතු සහ නිපුණ ශ්‍රම බලකායක් සංවර්ධනය කිරීමට පහසුකම් සැලසීමට ව්‍යවසාය පාදක පුහුණුව ප්‍රසාරණය කිරීම සහ සංවර්ධනය කිරීම.
- පුහුණු ආයතන සහ සේවකයන් අතර සබඳතාවයන් සපුරා දීම.

ආයතනය ස්ථාපනය කිරීම

සී / ස නිපුණතා සංවර්ධන අරමුදල යනු කාර්මික අධ්‍යාපනය හා වෘත්තීය පුහුණුව පිළිබඳ ජනාධිපති කාර්යසාධන බලකායේ නිර්දේශය මත 1998 දී නියමු ව්‍යාපෘතියක් ලෙස පිහිටුවන ලද්දකි. මෙම කාලය තුළ ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල එයට අනුග්‍රහය දැක්වීය.

1999 අගෝස්තු 20 වන දින, සීමාසහිත වගකීම් සමාගමක් ලෙස, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සී / ස නිපුණතා සංවර්ධන අරමුදල සංස්ථාගත කරන ලදී. ලි.ප. අංකය: N(PBS)832.

1999 වසරේ සැප්තැම්බර් මාසයේදී සමාගමේ කොටස් මිළදී ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලය රු. දසලක්ෂ 100 ක මුදලක් අනුමත කළ අතර, අරමුදල විසින් එය සුරක්ෂිත ලෙස ආයෝජනය කරන ලදී. මෙම සුරක්ෂිත ආයෝජනයෙන් ලැබෙන ආදායමත්,සමාගමේ මෙහෙයුම් මගින් ලැබෙන ආදායමත් අරමුදලේ පුණරාවර්ථන වියදම් සඳහා ප්‍රමාණවත් බවට යෝජනා කරන ලදී. නිපුණතා සංවර්ධන අරමුදල ස්වයං ආදායම් උත්පාදක ආයතනයක් ලෙසද, රජයේ මුල් ආයෝජනය, ලංකා හාම්පුතුන්ගේ සම්මේලනය සහ වෙනත් ආයෝජකයන් ආරක්ෂිත බවද මෙම සැකසුම් වලින් තහවුරු වේ.

සී /ස නිපුණතා සංවර්ධන අරමුදල 2007 අංක 07 දරන නව සමාගම් ආඥා පනත යටතේ සීමාසහිත සමාගමක් ලෙස නැවත ලියාපදිංචි කරන ලද අතර, ලියාපදිංචි අංකය PB 833 වේ.

2020 වසර ආරම්භයේදී මෙම ආයතනය නිපුණතා සංවර්ධන, රැකියා සහ කම්කරු සබඳතා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විය. 2020 අගෝස්තු 09 දින නිකුත් කරන ලද අති විශේෂ ගැසට් නිවේදනයක් මගින් එය මුදල් අමාත්‍යාංශය යටතට පත් කරන ලදී.

ඒ අනුව එදින සිට 2020.12.31 දක්වා මුදල් අමාත්‍යාංශය යටතේ සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල ක්‍රියාත්මක විය.

ආයතන ව්‍යුහය


සභාපති සහ අධ්‍යක්ෂක මණ්ඩලය
සාමාන්‍යාධිකාරී
වැඩසටහන් උපදේශක
ගණකාධිකාරී
වැඩසටහන් නිලාධාරී
පරිපාලන නිලධාරී
පුහුණු උපදේශක
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
රියදුරු
කාර්යාල සහායක

සී/ස නිපුණතා සංවර්ධන අරමුදලේ සේවක සංඛ්‍යාව

2020.12.31. දිනට කාර්ය මණ්ඩලය

තනතුර	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව
1. සභාපති / ප්‍රධාන විධායක නිලධාරී	01	01
2. සාමාන්‍යාධිකාරී	01	00
3. වැඩසටහන් උපදේශක	02	01
4. ගණකාධිකාරී	01	01
5. වැඩසටහන් නිලධාරී	02	01
6. පරිපාලන නිලධාරී	01	01
7. පුහුණු උපදේශක	02	02
8. කළමනාකරණ සහකාර	18	18
9. රියදුරු	02	02
10. කාර්යාල කාර්ය සහායක	03	07
මුළු එකතුව	33	34

අධ්‍යක්ෂක මණ්ඩලය - 2020

නිපුණතා සංවර්ධන අරමුදල අධ්‍යක්ෂවරුන් 12 කින් සමන්විත අතර, මහා භාණ්ඩාගාරය විසින් ඔවුන් පත් කර ඇත. ඔවුන්ගේ විස්තර පහත පරිදි වේ.

අධ්‍යක්ෂක මණ්ඩලය 2020 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා

01. ඉංජිනේරු (ආචාර්ය) ලයනල් පින්ටෝ මහතා - (සභාපති)
02. මනෝරි ලියනගේ මිය - (භාණ්ඩාගාරයේ අධ්‍යක්ෂක)
03. ප්‍රියංකා පෙරේරා මිය - (රේඛීය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ)
04. මහාචාර්ය. කේ.ආර්.කොස්වත්තගේ මහතා.
05. ඉංජිනේරු. රොහාන් තුඩාවේ මහතා.
06. ඉෂාන් දන්තනාරායන මහතා.
07. සුරේෂ් ඩී.ද මෙල් මහතා.
08. දිනුක් හෙට්ටිආරච්චි මහතා.
09. රන්ජන් අමරසිංහ මහතා.
10. නාමල් බාලචන්ද්‍ර මහතා.
11. ජාලිය විජේරත්න මහතා..
12. ආචාර්ය එස්.පී.ඩබ්. ජයසිරිවර්ධන මහතා.

අධ්‍යක්ෂක මණ්ඩලය 2020 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා

01.ඉංජිනේරු (ආචාර්ය) ලයනල් පින්ටෝ - (සභාපති)
02.මනෝරි ලියනගේ මිය - (භාණ්ඩාගාරයේ අධ්‍යක්ෂක)
03.ජේ.කේ.එන්. සමන්මලී මිය - (රේඛීය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ)
04. මහාචාර්ය. කේ.ආර්.කොස්වත්තගේ මහතා.
05. ඉංජිනේරු. රොහාන් තුඩාවේ මහතා.
06. ඉෂාන් දන්තනාරායන මහතා.
07. සුරේෂ් ඩී.ද මෙල් මහතා.
08. දිනුක් හෙට්ටිආරච්චි මහතා.
09. රන්ජන් අමරසිංහ මහතා.
10. නාමල් බාලචන්ද්‍ර මහතා.
11. ජාලිය විජේරත්න මහතා..
12. ආචාර්ය එස්.පී.ඩබ්. ජයසිරිවර්ධන මහතා.

2020 වසරේ අධ්‍යක්ෂ මණ්ඩල සභා වාර 01 ක් පහත දිනයන්වලදී නාරාහේන්පිට සී /ස නිපුණතා සංවර්ධන අරමුදල් කාර්යාලයේදී පවත්වන ලදී. කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් 2020 වසරේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීමට නොහැකි විය.

දිනය	සහභාගිත්වය
2020.07.03	10

කාර්යසාධන සමාලෝචනය
වැඩසටහන්

ඵලදායි සහ ප්‍රතිඵල ලබාදෙන ජීවිත ගත කිරීමට උපකාරීවන තෝරා ගැනීම් සාදා ගැනීමට සහ වැඩවලදී ඔවුන්ගේ ජීවිතවල ගුණාත්මකභාවය වර්ධනය කිරීම, නම්‍යශීලී ශ්‍රම බලකායක් සඳහා සහයෝගය ලබා දෙන, පුහුණුව සඳහා සහභාගීත්වය වැඩි කෙරෙන රජයේ සහ පුද්ගලික අංශයේ සේවකයන්හට සහයෝගය ලබා දීමට ශ්‍රී ලංකාවේ ශක්තිමත් සහ වඩා තරඟකාරී පුහුණු ආයතනයක් ගොඩ නැගීමට නිපුණතා සංවර්ධන අරමුදලේ මෙහෙවර වේ.

සේවකයන්හට සිය දැක්ම සහ මෙහෙවර ඉටු කර ගැනීමට සහාය ලබා දීමේදී මානව සම්පත් සහ නිපුණතා සංවර්ධනය කිරීමට සහයෝගය ලබාදෙන ඔවුන්ගේ රැකියා කාලය පුරාවට බලපාන පුහුණු වැඩසටහන් සහ සේවාවන් බෙදා හැරීම නිපුණතා සංවර්ධන අරමුදල මගින් ඉටු කෙරේ. අතීතයේදී, නිපුණතා සංවර්ධන අරමුදල විසින් ආයතනයන් හරහා කාර්යක්ෂමතාවය සහ සහයෝගය ප්‍රවර්ධනය කෙරෙන වෙනස්කම්, නිර්මාණ සහ නවීකරණයන් ඉටු කිරීම සහ නව ව්‍යාපාර ක්‍රියාපරිපාටීන් ක්‍රියාත්මක කිරීම සිදු කරන ලදී. ලංසු ඇගයීම පිළිබඳ පුහුණුව, වැටුප් පරිවර්තනය, මූල්‍ය නායකත්වය, පුරුක් කළමණාකාරීත්වය සැපයීම ආදිය හඳුන්වා දෙමින් ප්‍රමුඛතා ගණනාවක් එකේළි කිරීම, එහි මූල්‍ය ඉලක්කයන් කරා ළඟාවීම, එහි කාර්යන් ඉටු කරන ආකාරය නවීකරණය කිරීම සහ රාජ්‍ය සහ පුද්ගලික අංශය යන දෙකෙහිම සේවකයන් සහ සේව්‍යයන් යන දෙපිරිසම හොඳම සේවාවන් ලබන බවට තහවුරු කිරීම සී / ස නිපුණතා සංවර්ධන අරමුදලේ අබීප්‍රායන් ඉලක්ක ගත කෙරේ.

2020 වසර නිපුණතා සංවර්ධන අරමුදලේ ප්‍රයත්නයන් වූයේ රාජ්‍ය සහ පුද්ගලික අංශයේ සේවකයන්හට සෘජු බලපෑමක් ඇති කරන යම් වැදගත් ජයග්‍රහණයන් සඳහා උපකාරවන වැඩසටහන්වල සහ වෘත්තීයමය පාඨමාලාවල ඵලදායිතාවය සහ කාර්යක්ෂමභාවය වර්ධනය කිරීමයි. සහභාගිවන්නන් 2,628 කට වැඩි ප්‍රමාණයක් සඳහා පුහුණු වැඩසටහන් අඛණ්ඩව නවීකරණය කිරීම ද සිදු කෙරේ.

විවිධ ආකාරයන් යටතේ 2020 වසරේ පවත්වන ලද වැඩසටහන් පහත පරිදි වේ.

වැඩසටහන්වල ආකාරය	වැඩසටහන් ගණන	සහභාගී වූ සංඛ්‍යාව
විවෘත වැඩසටහන්	49	1289
සේවාලාභීන් සඳහා වැඩසටහන්	24	1191
විභාග	07	148

වැඩසටහන්වල ආදායම, වියදම සහ ලාභය

සී / ස නිපුණතා සංවර්ධන අරමුදලේ ප්‍රධාන ආදායම් මූලාශ්‍රයන්වන බැංකු පොළිය / භාණ්ඩාගාර තැන්පතු හැරුණුවිට වැඩසටහන් සහ උපදේශන සේවාවන් මගින් සැලකිය යුතු ආදායමක් අරමුදල විසින් උපයනු ලබයි. 2019 සහ 2020 වසරවල විවිධ ආකාරයේ වැඩසටහන් මගින් උපයන ලද ආදායම්,වියදම්, සහ ලාභය න් පහත වගුවෙන් පෙන්නුම් කෙරේ.

2019 (රු. මිලියන)			**2020 (රු. මිලියන)**		
ආදායම	වියදම	ලාභය	ආදායම	වියදම	ලාභය
74.76	33.08	42.81	18.3	5.8	12.5

2020 වසර සලකා බලන කල සියළුම වැඩසටහන් රු. මිලියන 12.5 ක ලාභාංශ මත පවත්වන ලදී. එය සැබවින්ම සී / ස නිපුණතා සංවර්ධන අරමුදලේ වැඩසටහන් කාර්ය මණ්ඩලයේ සහ අනෙකුත් සහයෝගී කාර්ය මණ්ඩලයේ කැපවීම මත ඉපැයීමකි.

2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන

(2020/2021)

සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල

“නිපුණතා පියස” , 7 වන මහල, 354/2, ඇල්විටිගල මාවත, **කොළඹ 05, ශ්‍රී ලංකාව**

2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

	සටහන	2020/2021 රු. ශත	2019/2020 රු. ශත
පිරිවැටුම	03	16,833,187.50	69,605,960.00
සෘජු පිරිවැය	04	(6,232,043.38)	(32,994,642.56)
දළ ලාභය / (අලාභය)		**10,601,144.12**	**36,611,317.44**
වෙනත් ආදායම්	05	-	2,500.00
		10,601,144.12	**36,613,817.44**
පරිපාලන හා ආයතනික වියදම්	06	38,013,344.78)	(45,026,558.85)
පොලී හා බදු වලට පෙර ආදායම		**(27,412,200.66)**	**(8,412,741.41**
ශුද්ධ මූල්‍ය ආදායම	07	9,380,267.70	14,275,435.34
බදු පෙර ලාභය		**(18,031,932.96)**	**5,862,693.93**
ආදායම් බදු	14	2,546,391.55	(5,522,486.81)
වර්ෂය සඳහා ශුද්ධ ලාභය/(අලාභය)		**(15,485,541.41)**	**340,207.12**
අනෙකුත් විස්තීර්ණ ආදායම්		(216,580.74)	498,179.00
නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මේ -- ලාභය/(අලාභය)			
වර්ෂය සඳහාම මුළු විස්තීර්ණ ආදායම		**(15,702,122.15)**	**838,386.12**
කොටසක ඉපයීම	18	**(1.54)**	**0.08**

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.
වරහන් තුළ ඇති සංඛ්‍යා අඩු කිරීම් පෙන්නුම් කරයි.

සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල

2021 මාර්තු 31 දිනට

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

	සටහන	2020/2021 රු. ශත	2019/2020 රු. ශත
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	**08**	4,199,807.04	6,843,600.64
ස්ථාවර තැන්පතු - ශිෂ්‍යත්ව අරමුදල		5,181,386.35	4,883,250.59
ජංගම වත්කම්			
තොග		640,354.73	658,347.60
ආයෝජන	**09**	154,765,097.74	153,897,430.80
වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ	**10**	19,766,796.22	22,517,000.53
ආදායම් බදු නැවත ගෙවීම්		1,296,872.18	1,296,872.18
විලම්භිත බදු වත්කම්	**15**	4,644,880.42	842,700.21
මුදල් හා මුදල් සමාන දෑ	**11**	6,803,474.82	20,652,450.66
මුළු වත්කම්		**197,298,669.50**	**211,591,653.21**
හිමිකම් හා වගකීම්			
ප්‍රාග්ධනය සහ සංචිත			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	**12**	102,001,520.00	102,001,520.00
ආදායම් සංචිත		479,890.00	479,890.00
අනෙකුත් සංචිත		-	-
රදවාගත් ලාභ		83,128,480.16	97,574,813.65
මුළු හිමිකම		**185,609,890.16**	**200,056,223.65**
ජංගම නොවන වගකීම්			
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම	**13**	3,658,650.82	3,225,347.00
නිපුණතා සංවර්ධන අර්ථසාධක අරමුදල	**16**	4,873,197.75	4,575,061.99
ජංගම වගකීම්			
වෙළෙඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ	**17**	3,156,930.77	3,735,020.57
මුළු හිමිකම හා වගකීම්		**197,298,669.50**	**211,591,653.21**

2007 අංක 7 සමාගම් පනතේ අවශ්‍යතාවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති බව සහතික කර ඇත.

....

ගණකාධිකාරී දිනය

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම ගනු ලැබේ. සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සහ ඒ වෙනුවෙන් අත්සන් කර අනුමත කර ඇත.

....

සභාපති දිනය

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.
වරහන් තුළ ඇති සංඛ්‍යා අඩු කිරීම් පෙන්නුම් කරයි.

සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල
"නිපුණතා පියස" , 7 වන මහල, 354/2, ඇල්විටිගල මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව

2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

ප්‍රාග්ධනය	ප්‍රකාශිත ප්‍රාග්ධනය	ආදායම් සංචිත	අනෙකුත් සංචිත	රදවාගත් ලාභ	එකතුව
	රු. ශත	රු. ශත	රු. ශත	රු. ශත	රු. ශත
2019 අප්‍රේල් 01 දිනට ශේෂය	102,001,520.00	479,890.00	(297,303.29)	97,275,996.08	199,460,102.79
වර්ෂය තුල ශුද්ධ ලාභය	-	-	-	340,207.12	340,207.12
අනෙකුත් විස්තීර්ණ ආදායම්	-	-	-	498,179.00	498,179.00
පෙර වර්ෂ ගැලපීම්	-	-	297,303.29	(539,568.55)	(242,265.26)
2020 මාර්තු 31 දිනට ශේෂය	**102,001,520.00**	**479,890.00**	**-**	**97,574,813.65**	**200,056,223.65**
2020 අප්‍රේල් 01 දිනට ශේෂය	102,001,520.00	479,890.00	-	97,574,813.65	200,056,223.65
වර්ෂය තුල ශුද්ධ ලාභය	-	-	-	(15,485,541.41)	(15,485,541.41
අනෙකුත් විස්තීර්ණ ආදායම්	-	-	-	(216,580.74)	(216,580.74
පෙර වර්ෂ ගැලපීම්	-	-	-	1,255,788.66	1,255,788.66
2021 මාර්තු 31 දිනට ශේෂය	**102,001,520.00**	**479,890.00**	**-**	**83,128,480.16**	**185,609,890.16**

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.
වරහන් තුළ ඇති සංඛ්‍යා අඩු කිරීම් පෙන්නුම් කරයි

සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල
"නිපුණතා පියස" , 7 වන මහල, 354/2, ඇල්විටිගල මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව
2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2020/2021 රු. ශත	2019/2020 රු. ශත
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත /(භාවිත) මුදල් ප්‍රවාහය		
බදු පෙර ශුද්ධ ලාභය/අලාභය	(18,031,932.96)	5,862,693.93
ගැලපීම්		
ක්ෂය	2,925,771.60	2,954,458.69
ස්ථාවර වත්කම් අපහරණ අලාභ	-	29,403.16
පොලී ආදායම	(9,380,267.70)	(14,275,435.34)
මූල්‍ය පිරිවැය	40,965.00	85,454.95
පාරිතෝෂික වෙන්කිරීම්	708,940.58	706,397.00
කාරක ප්‍රාග්ධනයට පෙර මෙහෙයුම් ලාභය	**(23,736,523.48)**	**(4,637,027.61)**
තොග (වැඩිවීම)/අඩුවීම	17,992.87	4,408.12
වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම	2,750,204.31	1,817,067.91
වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ වැඩිවීම/(අඩුවීම)	(578,089.80)	(1,190,690.35)
තරුණ කටයුතු අමාත්‍යාංශයට ගෙවිය යුතු දෑ වැඩිවීම/(අඩුවීම)	298,135.76	418,684.00
මෙහෙයුම් කටයුතු මගින් ජනිත ශුද්ධ මුදල්	**(21,248,280.34)**	**(3,587,557.93)**
පාරිතෝෂික ගෙවීම්	(492,217.50)	(130,235.00)
ගෙවන ලද මූල්‍ය පිරිවැය	(40,965.00)	(85,454.95)
මෙහෙයුම් කටයුතු මගින් ශුද්ධ මුදල් ප්‍රවාහය	**(21,781,462.84)**	**(3,803,247.88)**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත /(භාවිත) මුදල් ප්‍රවාහය		
ස්ථාවර තැන්පතු වල ආයෝජනය	(867,666.94)	(1,170,930.04)
ලද පොලී ආදායම	9,380,267.70	14,275,435.34
දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම්	(281,978.00)	(1,770,533.15)
දේපළ, පිරියත සහ උපකරණ විකිණීම්	-	13,200.00
ශිෂ්‍යත්ව අරමුදලේ ආයෝජන - ස්ථාවර	(298,135.76)	(404,396.31)
ආයෝජන කටයුතු මගින් ජනිත ශුද්ධ මුදල්	**7,932,487.00**	**10,942,775.84**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත /(භාවිත) මුදල් ප්‍රවාහය		
ලාභාංශ ගෙවීම්	-	-
මූල්‍ය කටයුතු මගින් ජනිත ශුද්ධ මුදල්	-	-
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ මුදල් වැඩිවීම / අඩුවීම	**(13,848,975.84)**	**7,139,527.96**
කාලපරිච්ඡේදය ආරම්භයේ පැවති මුදල් හා මුදල් සමාන දෑ	20,652,450.66	13,512,922.70
කාලපරිච්ඡේදය අවසානයේ පැවති මුදල් හා මුදල් සමාන දෑ	**6,803,474.82**	**20,652,450.66**
මුදල් හා මුදල් සමාන දෑ		
බැංකුවේ ඇති මුදල් - BOC-801	3,095,450.72	3,663,155.91
ලංකා බැංකුව - ගිණුම් අංක 764148708	161,076.00	161,076.00
ඇමතුම් තැන්පතු	3,474,369.10	16,745,443.75
අතැති මුදල්	72,579.00	82,775.00
	6,803,474.82	**20,652,450.66**

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.
වරහන් තුළ ඇති සංඛ්‍යා අඩු කිරීම් පෙන්නුම් කරයි.

සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල
“නිපුණතා පියස” , 7 වන මහල, 354/2, ඇල්විටිගල මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020/2021

01. පොදු

1.1 නෛතික තත්ත්වය

සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල යනු ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත සහ වාසස්ථානය වන සීමිත වගකීම් සහිත සමාගමකි. ලියාපදිංචි සමාගම සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය "නිපුනත පියස", 7 වන මහල, 354/2, ඇල්විටිගල මාවත, කොළඹ 05 හි පිහිටා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ව්‍යාපාරයේ ස්වභාවය

වර්ෂය තුල සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ

- රැකියා ප්‍රවේශ පුහුණුව, නිපුණතා වැඩිදියුණු කිරීම සහ සේවකයින් නැවත පුහුණු කිරීම සඳහා සහාය වීම.
- ඉහළ පුහුණු සහ නිපුණතා සහිත ශ්‍රම බලකායක් සංවර්ධනය කිරීමට පහසුකම් සැලසීම සඳහා ව්‍යවසාය පදනම් කරගත් පුහුණුව පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම.
- පුහුණු ආයතන සහ සේවා යෝජකයින් අතර සම්බන්ධයක් ලබා දීම.

1.3 නිකුත් කිරීම සඳහා අධිකාරී බලය දීම

ප්‍රකාශන 2021 මාර්තු 31 දිනෙන් අවසන් වන වසර සඳහා සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදලේ මූල්‍ය නිකුත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2021 අගෝස්තු 30 දින අවසර ලබා දී ඇත.

1.4 පිළියෙල කිරීමේ පදනම

1.4.1 අනුකූලතා ප්‍රකාශය

විස්තීරණ ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් (“මූල්‍ය ප්‍රකාශන”) සමඟින් සමන්විත මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (CA ශ්‍රී ලංකා) විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණය ප්‍රමිති (SLFRS/ LKAS) සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවයට අනුකූලව සකස් කර ඇත.

1.4.2 අඛණ්ඩභාවය

අධ්‍යක්ෂවරුන් සමාගමට ඉදිරියට යාමට ඇති හැකියාව පිළිබඳව තක්සේරුවක් කර ඇති අතර ඔවුන් ඇවර කිරීමට හෝ ව්‍යාපාරය නැවැත්වීමට අදහස් නොකරයි.

1.4.3 ඉදිරිපත් කිරීමේ පදනම

මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ පහත සඳහන් ද්‍රව්‍ය අයිතම හැර මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත සහ ඓතිහාසික පිරිවැය පදනම යටතේ සකස් කර ඇත.

• විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් ආයුගණක තක්සේරුව මත පදනම්ව හඳුනාගෙන ඇත. (LKAS - 19) (සටහන 13)

මූල්‍ය ප්‍රකාශනවල උද්ධමන සාධක සඳහා ගැලපීම් සිදු කර නොමැත

1.4.4 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන්නේ සමාගමේ ක්‍රියාකාරී මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ය. ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති සියලුම මූල්‍ය තොරතුරු වෙනත් ආකාරයකින් ප්‍රකාශ කර නොමැති නම්, ආසන්නතම රුපියලට වටයා ඉදිරිපත් කර ඇත.

1.4.5 ඇස්තමේන්තු සහ විනිශ්චයන් භාවිතා කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS/LKAS) අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කිරීම සහ වාර්තා කළ වත්කම්, බැරකම්, ආදායම් සහ වියදම්වල වටිනාකම් කෙරෙහි බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීම කළමනාකරණයට අවශ්‍ය වේ.

විනිශ්චයන් සහ ඇස්තමේන්තු ඓතිහාසික අත්දැකීම්, ප්‍රවණතා සහ අපේක්ෂිත තත්වයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කරන අනෙකුත් සාධක මත පදනම් වේ. ඒ අනුව, සැබෑ ප්‍රතිඵල මෙම විනිශ්චයන් සහ ඇස්තමේන්තු වලින් වෙනස් විය හැක.

ඇස්තමේන්තු සහ දක්වා ඇති උපකල්පනවල වලංගුභාවය සහතික කිරීම සඳහා අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කෙරේ. ඇස්තමේන්තු සංශෝධනය වූ කාල පරිච්ඡේදයේදී සහ බලපෑමට ලක්වන ඕනෑම අනාගත කාල පරිච්ඡේදයකදී ගිණුම්කරණ ඇස්තමේන්තු සංශෝධන ලෙස හඳුනා ගැනේ. මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇති වටිනාකමට වඩාත්ම වැදගත් බලපෑමක් ඇති කරන ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගැනීමේදී තීරණාත්මක විනිශ්චයන් පිළිබඳ තොරතුරු පහත සටහන්වල ඇතුළත් වේ:

සටහන 13- නිශ්චිත ප්‍රතිලාභ වගකීම් මැනීම

1.4.6 සංසන්ධනාත්මක තොරතුරු

පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය වඩාත් හොඳ ඉදිරිපත් කිරීමක් සඳහා අදාළ වන පරිදි සහ වත්මන් වර්ෂය සමඟ සැසඳිය හැකි පරිදි සංශෝධනය කර ඇත.

2. ප්‍රධාන ගිණුම්කරන ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී යොදාගන්නා ලද ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත. මෙම ප්‍රතිපත්ති වෙනත් ආකාරයකින් ප්‍රකාශ නොකළහොත් ඉදිරිපත් කරන ලද සියලුම වසර සඳහා අඛණ්ඩව යෙදී ඇත.

2.1 වත්කම් සහ ඒවා අගය කිරීමේ පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති වත්කම් වන්නේ මුදල්, බැංකු ශේෂයන් සහ සමාගමේ ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ හෝ වාර්තා කළ දින සිට වසරක් ඇතුළත මුදල් වශයෙන් සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කරන ඒවා වේ. ජංගම වත්කම් හැර අනෙකුත් වත්කම්, වාර්තා කළ දින සිට වසරක කාල සීමාවකින් ඔබ්බට සමාගම තබා ගැනීමට අදහස් කරන ඒවා වේ.

2.1.1 දේපළ, පිරියත සහ උපකරණ

2.1.1.1 හඳුනාගැනීම සහ මැනීම

දේපල, පිරියත සහ උපකරණ දක්වා ඇත්තේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිකරණ පාඩු අඩුකර දක්වා ඇත.

මෙම පිරිවැයට අත්පත් කර ගැනීමේ පිරිවැය සහ වත්කම එහි ක්‍රියාකාරී තත්ත්වයට හෝ අපේක්ෂිත භාවිතයට ගෙන ඒම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි වියදම් ඇතුළත් වේ. ස්වයං-ගොඩනගන ලද වත්කම්වල පිරිවැයට ද්‍රව්‍ය පිරිවැය, සෘජු ශ්‍රමය සහ වත්කම් වැඩ කරන තත්වයට හෝ එහි අපේක්ෂිත භාවිතයට ගෙන ඒම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි වෙනත් වියදම්ද ඇතුළත් වේ. දැනට පවතින වත්කම් කොටස් වශයෙන් වෙන් කිරීමේ සහ ඉවත් කිරීමේ පිරිවැය ද මෙයට ඇතුළත් ය.

නොනිමි ප්‍රාග්ධන වැඩ ප්‍රථමයෙන් භාවිතයට ගත් අවස්ථාවේදී හෝ වත්කම පැවරූ අවස්ථාවේ දී අදාළ වත්කම් ගිණුම් වෙත මාරු කරනු ලැබේ. කෙසේ වෙතත් වාර්තා කරන දිනට කිසිදු ප්‍රාග්ධන කාර්යයක් ප්‍රගතියේ නැත.

දේපල, පිරියත සහ උපකරණ සඳහා වෙනස් ප්‍රයෝජනවත් ජීව කාලයන් ඇති විට, ඒවා දේපල, පිරියත හා උපකරණවල වෙනම අයිතම (ප්‍රධාන සංරචක) ලෙස ගණන් ගනු ලැබේ.

දේපල, පිරියත සහ උපකරණවල අයිතමයක් ඉවත් කිරීමේ ලාභ සහ අලාභයන්, ඉවත් කිරීමෙන් ලැබෙන ආදායම සහ දේපල, පිරියත සහ උපකරණ ධාරණ අගය අතර වෙනස මගින් ගණ නය කරනු ලබන අතර, විස්තීරණ ආදායම් ප්‍රකාශයේ වෙනත් ආදායම් යටතේ දක්වනු ලැබේ.

2.1.1.2 ආසන්නතම වියදම්

පවත්නා දේපල, පිරියත සහ උපකරණ සඳහා දරන ලද වියදම් ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ එම වියදම් මුලින් තක්සේරු කළ අගයට වඩා අනාගත ආර්ථික ප්‍රතිලාභ ඉක්මවන හා එහි පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි යැයි අපේක්ෂා කරන විටය. ප්‍රතිස්ථාපිත වත්කමේ අගය හඳුනා නොගනී.

දේපල, පිරියත සහ උපකරණවල එදිනෙදා සේවා/ නඩත්තුව සඳහා වන වියදම් විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ දැරූ වියදම් ලෙස දක්වයි. ප්‍රත්‍යාගණනය කරන ලද වත්කමක් අපහරණය කළ විට, ප්‍රත්‍යාගණන අතිරික්ත සංචිතයේ අගය රඳවා ගත් ලාභ වෙත මාරු කරනු ලැබේ.

2.1.1.3 නැවත හඳුනාගැනීම

දේපල, පිරියත සහ උපකරණවල ඉදිරියට රැගෙන යාමේ අගය බැහැර කිරීමේදී හෝ එය භාවිතා කිරීමෙන් හෝ බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට හඳුනා නොගනී. විස්තීරණ ආදායම් ප්‍රකාශයේ වෙනත් ආදායම් යටතේ හඳුනාගැනීම් ඉවත් කිරීමේ ලාභ හෝ අලාභ හඳුනා ගැනේ.

2.1.1.4 ණය ගැණුම් පිරිවැය

එහි අපේක්ෂිත භාවිතය හෝ විකිණීම සඳහා සූදානම් වීමට සැලකිය යුතු කාලයක් ගත වන, සුදුසුකම් ලත් වත්කමක් අත්පත් කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය කිරීම සඳහා සෘජුවම

ආරෝපණය කළ හැකි ණය ගැනීමේ පිරිවැය, වත්කමේ කොටසක් ලෙස ප්‍රාග්ධනිත කර ඇත. ප්‍රාග්ධනිත කිරීම සඳහා සුදුසුකම් ලබන ණය ගැනීමේ පිරිවැයේ අගයන් ශ්‍රී.ල.ගි.ප්‍ර. 23 - ණය ගැනීමේ පිරිවැයට අනුකූලව ගණනය කර තිබේ.

ප්‍රාග්ධනිත නොකරන ලද ණය ගැනීමේ පිරිවැය, ඒවා දරනු ලබන කාල සීමාව තුළ වියදම් ලෙස හඳුනාගෙන විස්තීරණ ආදායම් ප්‍රකාශයට අය කෙරේ.

2.1.1.5 ක්ෂය කිරීම සහ ක්‍රමක්ෂය

ක්ෂය අගය ගණනය කරනු ලබන්නේ වත්කමක පිරිවැය වන ක්ෂය කළ හැකි අගයෙන් හෝ පිරිවැය වෙනුවට වෙනත් ආදේශ කළ හැකි අගයෙන් එහි සුන්බුන් අගය අඩුකළ අගයට ය. ලාභය හෝ අලාභය සඳහා එක් එක් වත්කමේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය පුරා සරල රේඛීය පදනමක් මත ක්ෂයවීම් හඳුනාගනු ලැබේ, මන්ද වත්කම් තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභවල අපේක්ෂිත පරිභෝජන රටාව මෙය වඩාත් සමීපව පිළිබිඹු කරන බැවිනි.

ප්‍රවර්ථන සහ සංසන්දනාත්මක කාල පරිච්ඡේද සඳහා ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය පහත පරිදි වේ:

පරිගණක උපකරණ	වසර 04 යි
වෙනත් කාර්යාල උපකරණ	වසර 05 යි
මෝටර් වාහන	වසර 04 යි
නව කාර්යාල පරිශ්‍රය	වසර 10 යි
ලී බඩු සහ උපකරණ	වසර 10 යි

වත්කම් ක්ෂය වීම ආරම්භ වන්නේ එය භාවිතයට තිබෙන විටදී වන අතර වත්කම් ක්ෂය වීම නතර වන්නේ එම වත්කම විකිණීමට තබා ඇති බවට වර්ගීකරණය කළ දින හෝ වත්කමක් ලෙස හඳුනා නොගන්නා දින යන දිනවලින් මුල්ම දිනයට වේ.

ක්ෂය කරන ක්‍රමය, ප්‍රයෝජනවත් ජීවිත කාලය සහ සුන්බුන් අගයන් එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේ සමාලෝචනය කර අදාල නම් ගලපනු ලැබේ.

2.1.1.6 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

වත්කමක් හානිකරණය විය හැකි බවට ඇඟවීමක් තිබේද යන්න සමාගම සෑම වාර්තා කරන දිනකම තක්සේරු කරයි. එවැනි කිසියම් ඇඟවීමක් තිබේ නම්, හෝ වත්කමක් සඳහා වාර්ෂික හානිකරණය පරීක්ෂණයක් අවශ්‍ය වූ විට, සමාගම වත්කම් නැවත අයකරගත හැකි අගය පිළිබඳව ඇස්තමේන්තුවක් කරයි.

වත්කමක අයකරගත හැකි මුදල යනු භාවිතයේ පවතින වත්කමක වටිනාකම හෝ එහි සාධාරණ වටිනාකම යන අගයෙන් විකුණුම් පිරිවැය අඩුකළ පසු ලැබෙන අගයෙන් වඩා වැඩි අගය වන අතර වත්කම වෙනත් වත්කම්වලින් හෝ වත්කම් සමූහයකින් බොහෝ දුරට ස්වාධීනව මුදල් ගලා ඒම උත්පාදනය නොකරන්නේ නම්, තනි වත්කමක් ලෙස දැක්වේ. වත්කමක ධාරණ අගය එහි අයකරගත හැකි ප්‍රමාණය ඉක්මවන විට, වත්කම් හානි වූ ලෙස සලකනු ලබන අතර එවිට එහි අයකරගත හැකි මුදලට දක්වා ලියාහැර ඇත.

භාවිතයේ ඇති වටිනාකම තක්සේරු කිරීමේදී, ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් ඒවායේ වර්තමාන වටිනාකමට වට්ටම් කරනු ලබන්නේ පෙර බදු වට්ටම් අනුපාත භාවිතා

කරමින් වන අතර එය මුදල්වල කාල වටිනාකම සහ වත්කමට විශේෂිත වූ අවදානම පිළිබඳ වර්තමාන වෙළඳපල තක්සේරු කිරීම් පිළිබිඹු කරයි. විකුණුම් පිරිවැය අඩුකරන ලද සාධාරණ වටිනාකම තීරණය කිරීමේදී, මෑත කාලීන වෙළඳපල ගනුදෙනු ඇත්නම් ඒවාද සැලකිල්ලට ගනු ලැබේ. එවැනි ගනුදෙනුවක් හඳුනාගත නොහැකි නම්, සුදුසු තක්සේරු ආකෘතියක් භාවිතා කරනු ලැබේ.

අඛණ්ඩ මෙහෙයුම් වල හානිකරණ අලාභය, හානිවූ වත්කම්වල ක්‍රියාකාරිත්වයට අනුරූප වන එම වියදම් කාණ්ඩ තුලින් විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගෙන ඇත. කලින් හඳුනාගත් හානිකරණ අලාභයක් ආපසු හරවනු ලබන්නේ අවසන් හානිකරණ අලාභය හඳුනා ගැනීමෙන් පසුව වත්කම්වල අයකරගත හැකි මුදල තීරණය කිරීමට භාවිතා කරන ඇස්තමේන්තුවල වෙනසක් සිදුවී ඇත්නම් පමණි. එය එසේ විට, වත්කම් ධාරණ අගය එහි ආපසු ලබාගත හැකි අගය දක්වා වැඩි වේ. පෙර වසරවල වත්කම් සඳහා කිසිදු හානිකරණ අලාභයක් හඳුනාගෙන නොතිබුනේ නම්, එම වැඩි කළ මුදල, ක්ෂයවීම් අඩු කළ ධාරණ අගය ඉක්මවිය නොහැක. එවැනි ආපසු හැරීමක් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන තිබේ.

2.1.2 මූල්‍ය උපකරණ

2.1.2.1 මූල්‍ය අවදානම් කළමනාකරණය

ණය අවදානම

ණය අවදානම යනු ගනුදෙනුකරුවෙකු හෝ මූල්‍ය උපකරණයක ප්‍රතිවිරුද්ධ පාර්ශ්වයක් එහි ගිවිසුම්ගත බැඳීම් සපුරාලීමට අපොහොසත් වුවහොත් සහ ප්‍රධාන වශයෙන් ගනුදෙනුකරුවන්ගෙන් සහ අදාළ පාර්ශ්වයන්ගෙන් සමාගමට ලැබිය යුතු මුදල් වලින් සමාගමට සිදුවන මූල්‍ය අලාභයයි.

වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු සහ ආයෝජන සම්බන්ධයෙන් සිදු වූ පාඩු පිළිබඳ ඇස්තමේන්තුව නියෝජනය කරන හානිකරණ සඳහා සමාගම වෙන්කිරීමක් සිදු කරයි.

ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කම් ලබා දීමෙන් පියවා ගන්නා මූල්‍ය වගකීම් හා සම්බන්ධ වගකීම් සපුරාලීමේදී සමාගමට දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදුවන අවදානමයි. ද්‍රවශීලතාවය කළමනාකරණය කිරීම සඳහා සමාගමේ ප්‍රවේශය නම්, හැකිතාක් දුරට, සාමාන්‍ය සහ පීඩන තත්ත්වයන් යටතේ, පිළිගත නොහැකි පාඩු නොලබා හෝ සමාගමේ කීර්ති නාමයට හානියක් නොවන පරිදි, නියමිත වේලාවට එහි වගකීම් සපුරාලීමට ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් ඇති බව සහතික කිරීමයි.

පොලී අනුපාත අවදානම

වෙළඳපොල පොලී අනුපාත වෙනස් වීමේ අවදානමට සමාගම නිරාවරණය වීම මූලික වශයෙන් පාවෙන පොලී අනුපාත සමඟ සමාගමේ දිගුකාලීන ණය බැඳීම්වලට සම්බන්ධ වේ. ස්ථාවර සහ විචල්‍ය අනුපාත ණය සහ ණය ගැනීම්වල සමතුලිත කළඹක් තිබීම මගින් සමාගම සිය පොලී අනුපාත අවදානම කළමනාකරණය කරයි.

2.1.3 වෙළෙඳ ලැබිය යුතු දෑ

සමාගමට මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කම් ලබා ගැනීමට ගිවිසුම්ගත අයිතියක් ඇති විට පමණක්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වෙළඳ ලැබිය යුතු දෑ මූල්‍ය වත්කම් ලෙස සැලකේ.

වෙළඳ ලැබිය යුතු දෑ යනු සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී විකුණන ලද භාණ්ඩ හෝ සේවා සඳහා ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු මුදල් ය. වසරක් හෝ ඊට අඩු කාලයකින් එකතු කිරීම අපේක්ෂා කරන්නේ නම් (හෝ දිගු නම් ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයේ දී), ඒවා ජංගම වත්කම් ලෙස වර්ග කෙරේ. එසේ නොමැති නම්, ඒවා ජංගම නොවන වත්කම් ලෙස ඉදිරිපත් කෙරේ.

වෙළඳ ලැබිය යුතු දේ මූලිකව සාධාරණ වටිනාකමට හඳුනා ගැනේ. ඉන් පසුව, සමාගම විසින් ඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් හානිකරණ අලාභ අඩුකරන ලද ක්‍රමක්ෂය පිරිවැය යටතේ වෙළඳ ලැබිය යුතු දෑ මනිනු ලබයි.

ලැබිය යුතු දෑ සම්බන්ධයෙන් වන මූලික වගන්ති වලට අනුව සමාගමට ලැබිය යුතු සියලුම මුදල් එකතු කිරීමට නොහැකි වන බවට මූලික සාක්ෂි ඇති විට වෙළඳ ලැබිය යුතු දෑ සඳහා හානිකරණ ප්‍රතිපාදන සලසා තිබේ.

2.1.4 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමාන දෑ යන්නට මුදල් ශේෂයන්, ඇමතුම් තැන්පතු, ඉල්ලුම් තැන්පතු සහ දක්වන ලද මුදල් ප්‍රමාණයට පහසුවෙන් පරිවර්තනය කළ හැකි කෙටිකාලීන ඉහළ ද්‍රවශීල ආයෝජන ඇතුළත් වන අතර සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණු සඳහා ඉල්ලුම මත ආපසු ගෙවිය යුතු බැංකු අයිරා වල වටිනාකම වෙනස් වීමේ නොසැලකිය යුතු අවදානමකට යටත් වේ.

2.1.5 ප්‍රකාශිත ප්‍රාග්ධනය

ප්‍රකාශිත ප්‍රාග්ධනයට කොටස් නිකුතුව සම්බන්ධයෙන් සහ කොටස් සඳහා වන ඇමතුම් සම්බන්ධයෙන් සමාගමට ලැබුණු හෝ ගෙවිය යුතු සහ සමාගමට ගෙවිය යුතු සියලුම මුදල් එකතුව ඇතුළත් වේ.

2.1.6 වෙළෙඳ ගෙවිය යුතු දෑ

සමාගමට මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කම් ලබා දීමට ගිවිසුම්ගත බැඳීමක් ඇති විට පමණක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දී ගෙවිය යුතු වෙළඳ දෑ මූල්‍ය වගකීම් ලෙස හඳුනා ගනී.

වෙළඳ ගෙවිය යුතු දෑ යනු සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී සැපයුම්කරුවන්ගෙන් අත්පත් කරගත් භාණ්ඩ හෝ සේවා සඳහා ගෙවීමට ඇති බැඳීම් වේ. ගෙවිය යුතු දෑ ගිණුම් වසරක් හෝ ඊට අඩු කාලයක් තුළ ගෙවීමට සිදුවුවහොත් (හෝ දිගු නම් ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයේ) ජංගම වගකීම් ලෙස වර්ග කෙරේ. එසේ නොමැති නම්, ඒවා ජංගම නොවන වගකීම් ලෙස ඉදිරිපත් කෙරේ.

වෙළඳ ගෙවිය යුතු දෑ මුලින් සාධාරණ වටිනාකමට හඳුනාගෙන පසුව ඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැයෙන් මනිනු ලැබේ.

2.2 වගකීම් සහ වෙන්කිරීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කර ඇති වගකීම් යනු ඉල්ලුම මත හෝ වාර්තා කළ දින සිට වසරක් ඇතුළත ගෙවීමට නියමිත වගකීම් වේ. ජංගම නොවන වගකීම් යනු වාර්තා කළ දින සිට වසරකට පසු ගෙවීමට නියමිත ශේෂයන් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී දන්නා සියලුම වගකීම් ගිණුම්ගත කර ඇත.

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සමාගමට විශ්වාසදායක ලෙස ඇස්තමේන්තු කළ හැකි වර්තමාන නෛතික හෝ සාධනීය වගකීමක් තිබේ නම් සහ එම වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායාමක් අවශ්‍ය වේ නම් ඒ සඳහා වෙන්කිරීම් හඳුනාගනු ලැබේ.

2.2.1 සේවක ප්‍රතිලාභ

2.2.1.1 නිශ්චිත දායක සැලසුම් - සේ.අ.අ. (EPF) හා සේ.භා.අ. (ETF)

නිශ්චිත දායක සැලැස්මක් යනු පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලැස්මක් වන අතර ඒ යටතේ ආයතනයක් වෙනම ආයතනයකට ස්ථාවර දායක මුදල් ගෙවන අතර වැඩි මුදල් ප්‍රමාණයක් ගෙවීමට නීතිමය හෝ සාධනීය බැඳීමක් නොමැත. නිශ්චිත දායක විශ්‍රාම වැටුප් සැලසුම් සඳහා වන දායකත්වයන් සඳහා වන බැඳීම්, සේවකයින් විසින් සේවා සපයනු ලබන කාල පරිච්ඡේදවල ලාභ හෝ අලාභ වශයෙන් සේවක ප්‍රතිලාභ වියදමක් ලෙස පිළිගනු ලැබේ.

සමාගම විසින් සේවක අර්ථසාධක අරමුදලට (EPF) සේවකයන්ගේ දළ වැටුපෙන් 12%ක් දායක කරයි.

සියලුම සේවකයින් සේවක භාරකාර අරමුදල සඳහා සුදුසුකම් ලබා ඇති අතර, ඒම සේවකයින්ගේ දළ වැටුපෙන් 3% ක් සමාගම විසින් දායක වේ.

2.2.1.2 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - විශ්‍රාම පාරිතෝෂික

සාමාන්‍යයෙන් වයස, සේවා කාලය සහ වන්දි වැනි සාධක එකක් හෝ කිහිපයක් මත රඳා පවතින, විශ්‍රාම යාමේදී සේවකයෙකුට ලැබෙන ප්‍රතිලාභ ප්‍රමාණයක් අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ සැලසුම් නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් ලෙස නිර්වචනය කරයි.

සුදුසුකම් ලත් සියලුම සේවකයින් සඳහා 1983 අංක 12 දරන පාරිතෝෂිත ගෙවීම් පනත යටතේ අවශ්‍යතාව පරිදි සමාගම විසින් නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් සම්මත කර ඇත.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සම්බන්ධයෙන් මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ හඳුනාගෙන ඇති වගකීම, හඳුනා නොගත් අතීත සේවා පිරිවැය සඳහා වන ගැලපීම් සමඟ වාර්තා කරන දිනයේ දී අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ වගකීමේ වර්තමාන වටිනාකමට දක්වා ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය 19- සේවක ප්‍රතිලාභ වල දක්වා ඇති ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය භාවිතා කරමින් සමාගම විසින් නිශ්චිත ප්‍රතිලාභ වගකීම වාර්ෂිකව ගණනය කරනු ලැබේ. නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ වර්තමාන වටිනාකම තීරණය කරනු ලබන්නේ ප්‍රතිලාභ ගෙවනු ලබන මුදලින් නම් කෙරෙන සහ කල්පිරීමට නියමිත අදාළ විශ්‍රාම වැටුප් වගකීම් කොන්දේසි වලට ආසන්නව පවතින රජයේ බැඳුම්කරවල පොලී අනුපාත භාවිතා කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීමෙනි.

අත්දැකීම් ගැලපීම් සහ ක්‍රියාකාරී උපකල්පනවල වෙනස්වීම් හේතුවෙන් ඇතිවන ලාභ සහ අලාභ ඒවා පැන නගින කාල සීමාව තුළ වෙනත් විස්තීර්ණ ආදායම් වලට හර හෝ බැර කෙරේ.

සැලැසුමෙහි වෙනස්කම් නිශ්චිත කාලයක් සඳහා (the vesting period) සේවයේ රැඳී සිටින සේවකයින්ට කොන්දේසි සහිත වනනේ නම් හැර අතීත සේවා පිරිවැය විස්තීරණ ආදායම් ප්‍රකාශයේ ක්ෂණිකව හඳුනා ගැනේ. මෙහිදී, පසුගිය සේවා පිරිවැය නිරාවරණ කාල සීමාව තුළ සරල රේඛීය පදනමක් මත ක්ෂය කරනු ලැබේ.

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ සේවකයකුට වගකීම පැන නගින්නේ වසර 5 ක අඛණ්ඩ සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් පසුව පමණි.

විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් නිර්ණය කිරීමේදී භාවිතා කරන ප්‍රධාන උපකල්පන සටහන 13 හි දක්වා ඇත.

2.3 ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භව්‍යන්

අසම්භව්‍යන් යනු අතීත සිදුවීමකින් පැන නගින වත්කම් හෝ බැඳීම් වන අතර සමාගමේ පාලනයෙන් ඔබ්බට පවතින අවිනිශ්චිත අනාගත සිදුවීම් ඇතිවීම හෝ සිදු නොවීම මත පමණක් තහවුරු වේ.

සියලුම ප්‍රමාණාත්මක ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භව්‍ය වගකීම් සටහන් අංක 19 හි අනාවරණය කර ඇත.

2.4 විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

විස්තීරණ ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ අරමුණින් අධ්‍යක්ෂවරුන්ගේ මතය වන්නේ වියදම් ක්‍රමයේ ක්‍රියාකාරිත්වය සමාගමේ ක්‍රියාකාරිත්වයේ අංග සාධාරණ ලෙස ඉදිරිපත් කරන බව වන අතර එබැවින් LKAS 1 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ විධිවිධානවලට අනුකූලව එවැනි ඉදිරිපත් කිරීමේ ක්‍රමයක් අනුගමනය කෙරේ.

2.4.1 ආදායම් හඳුනාගැනීම

සමාගමට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමට ඉඩ ඇති ප්‍රමාණයට ආදායම හඳුනාගෙන ඇති අතර ආදායම සහ ඒ ආශ්‍රිත දරන ලද හෝ දැරිය යුතු පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකිය. විකුණුම් වලින් ශුද්ධ වෙළඳ වට්ටම් සහ විකුණුම් බදු ඉවත් කිරීමෙන් පසුව සලකා බලන ලැබුණු හෝ ලැබිය යුතු අගයේ සාධාරණ වටිනාකමට ආදායම මනිනු ලැබේ. ආදායම හඳුනාගැනීමේ අරමුණ සඳහා පහත සඳහන් නිශ්චිත නිර්ණායක භාවිතා කරනු ලැබේ.

2.4.1.1 සේවා සැපයීම

සේවා සැපයීමෙන් ලැබෙන ආදායම හඳුනාගනු ලබන්නේ සේවා සපයන ලද හෝ ඉටු කරන ලද ගිණුම්කරණ කාල සීමාව තුළ ය.

2.4.1.2 පොලී ආදායම

එකතු කිරීමේ හැකියාව සැක සහිත නොවේ නම් පොලී ආදායම උපචිත පොළිය ලෙස ගනු ලැබේ (වත්කම්වල ඵලදායී ආදායම සැලකිල්ලට ගනිමින්).

2.4.1.3 අපහරණය මත ලාභ හෝ අලාභ

දේපල, පිරියත සහ උපකරණවල අයිතමයක් අපහරණය කිරීමේ ලාභ සහ අලාභ තීරණය කරනු ලබන්නේ ශුද්ධ විකුණුම් ආදායම සමග දේපල, පිරියත සහ උපකරණ ධාරන අගය සංසන්දනය කිරීමෙන් වන අතර විස්තීරණ ආදායම් ප්‍රකාශයේ 'වෙනත් ආදායම්' තුළ හඳුනා ගැනේ.

2.4.2. වියදම් හඳුනාගැනීම

2.4.2.1 මෙහෙයුම් වියදම්

ව්‍යාපාරයේ එදිනෙදා ක්‍රියාකාරකම් වලදී සහ දේපල, පිරියත සහ උපකරණ කාර්යක්ෂමව පවත්වාගෙන යාමේදී දරනු ලබන සියලුම වියදම් වර්ෂය සඳහා ලාභ/ (අලාභ) වෙත ගැලපීමේදී විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට අයකරනු ලැබේ. මූල්‍ය නොවන වත්කම් හාණිකරණය, දන්නා සියලු වගකීම් සහ දේපළ, පිරියත සහ උපකරණවල ක්ෂයවීම් සඳහා ද ප්‍රතිපාදන සලසා ඇත.

පරිපාලන පිරිවැයේ ප්‍රතිශතය වැඩසටහනට අදාළ පිරිවැය ලෙස හඳුනාගෙන දළ ලාභය ලැබීමට සෘජු පිරිවැය ලෙස ගලපයි. පිරිවැය බෙදා හැරීමේ ප්‍රතිශත පහත පරිදි වේ.

ලිපි ද්‍රව්‍ය	75%
දුරකථන	90%
ඉන්ධන	60%
ප්‍රවාහනය	60%
අතිකාල	50%
මුද්දර ගාස්තු	100%

2.4.2.2බදු වියදම්

ආදායම් බදු වියදම ජංගම සහ විලම්භීත බදු වලින් සමන්විත වේ. විස්තීරණ ආදායම් ප්‍රකාශයේ ආදායම් බදු වියදම් හඳුනාගනු ලබන්නේ එය සමානව හඳුනාගත් විට, එය සෘජුවම කොටස් වශයෙන් හඳුනාගත් අයිතමවලට අදාළ වන තාක් දුරට හැර වේ.

2.4.2.2.1 ජංගම බදු වියදම

වත්මන් සහ සංසන්දනාත්මක කාලසීමාවන් සඳහා වත්මන් බදු වියදම මනිනු ලබන්නේ පසුව පනවන ලද නීති සම්පාදනය මගින් හෝ වාර්තා කිරීමේ දිනය සංශෝධිත 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ අංක 2 හි විධිවිධාන අනුව ගණනය කරන ලද අදාළ තක්සේරු වර්ෂය සඳහා දේශීය ආදායම් බදු කොමසාරිස් ජනරාල්වරයාට බදු ගෙවිය හැකි ආදායම මත ගෙවනු ලබන හෝ ගෙවීමට අපේක්ෂිත මුදල අනුව ය.

2.4.2.2.2 විලම්භීත බදු

මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා වත්කම් සහ වගකීම් ධාරණ අගය සහ බදුකරණ අරමුණු සඳහා භාවිතා කරන ප්‍රමාණයන් අතර තාවකාලික වෙනස්කම් සම්බන්ධයෙන්, ශේෂ පත්‍ර වගකීම් ක්‍රමය භාවිතයෙන් විලම්භීත බදුකරණය හඳුනා ගැනේ.

පහත සඳහන් තාවකාලික වෙනස්කම් සඳහා කල් දැමූ බද්ද හඳුනා නොගනී: ව්‍යාපාරික සංයෝජනයක් නොවන සහ ගිණුම්කරණයට හෝ බදු ගෙවිය හැකි ලාභයක් හෝ අලාභයක් කෙරෙහි බලපාන්නේ නැති ගනුදෙනුවකදී හඳුනා ගන්නා ලද වත්කම් හෝ වගකීම් සහ නුදුරු අනාගතයේදී ආපසු හැරවීමක් සිදු කිරීමට අපේක්ෂා නොකරන අනුබද්ධිත ආයතනවල සහ ඒකාබද්ධව පාලනය වන ආයතනවල ආයෝජන වේ. ඊට අමතරව, කීර්තිනාමය මූලිකව හඳුනාගැනීම මත පැන නගින බදු ගෙවිය හැකි තාවකාලික වෙනස්කම් සඳහාද විලම්භීත බදු හඳුනා නොගනී.

විලම්බිත බදු මනිනු ලබන්නේ, වාර්තා කරන දිනය වන විට පනවා ඇති හෝ පනවන ලද නීති මත පදනම්ව ඒවා ආපසු හැරවීමේදී තාවකාලික වෙනස්කම් සඳහා යෙදිය යුතු යැයි අපේක්ෂා කරන බදු අනුපාත වලටය. භාවිතයට නොගත් බදු පාඩු, බදු බැර කිරීම් සහ අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා කල් දැමූ බදු වත්කමක් ලෙස පිළිගන්නා අතර අනාගතයේ දී බදු

ගෙවිය හැකි ලාභයක් ලබා ගැනීමට හැකි වන තරමට ඒවා භාවිතා කළ හැකි වනු ඇත. විලම්බිත බදු වත්කම් සෑම වාර්තාකරණ දිනයකදීම සමාලෝචනය කරනු ලබන අතර අදාළ බදු ප්‍රතිලාභය සාක්ෂාත් කර ගැනීමට තවදුරටත් සම්භාවිතාවක් නොමැති වීම දක්වා අඩු කරනු ලැබේ.

ජංගම බදු වගකීම්වලට එරෙහිව ජංගම බදු වත්කම් හිලව් කිරීමට නීත්‍යානුකූලව බලාත්මක කළ හැකි අයිතියක් තිබේ නම් සහ විලම්බිත බදු එම බදු අය කළ හැකි ආයතනයට සහ එකම බදු අධිකාරියට සම්බන්ධ වූ විට විලම්බිත බදු වත්කම් සහ විලම්බිත බදු වගකීම් හිලව් කරනු ලැබේ.

2.5 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය 'වක්‍ර ක්‍රමය' භාවිතා කර සකස් කර ඇත. කල්බදු කුලී ගෙවීම්, ගෙවන ලද ලාභාංශ සහ ලැබෙන ප්‍රදාන මූල්‍ය මුදල් ප්‍රවාහ ලෙස වර්ග කර ඇති අතර ලැබෙන පොලී සහ ලැබෙන ලාභාංශ මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ අරමුණින් ආයෝජන මුදල් ප්‍රවාහ ලෙස වර්ග කෙරේ.

2.6 කොටසක ඉපයීම

සමාගම එහි සාමාන්‍ය කොටස් සඳහා කොටසක මූලික ඉපැයීම් (EPS) දත්ත ඉදිරිපත් කරයි. මූලික EPS ගණනය කරනු ලබන්නේ සමාගමේ සාමාන්‍ය කොටස් හිමියන්ට ආරෝපණය කළ හැකි ලාභය හෝ අලාභය කාල සීමාව තුළ ඉතිරිව ඇති බර තැබූ සාමාන්‍ය කොටස් සංඛ්‍යාවෙන් බෙදීමෙනි.

2.7 වාර්තාකරණ කාලයට පසු සිදුවීම්

වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසුව සිදුවන සිදුවීම් නම්, වාර්තාකරණ කාල සීමාවේ අවසාන දිනය සහ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට අවසර දී ඇති දිනය අතර සිදුවන වාසිදායක සහ අහිතකර සිදුවීම් වේ. වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසුව සිදුවන සිදුවීම්වල ප්‍රමාණාත්මකතාව සලකා බලනු ලබන අතර, අවශ්‍ය අවස්ථාවලදී මූල්‍ය ප්‍රකාශනවල සුදුසු ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කරනු ලැබේ.

සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල
"නිපුණතා පියස" , 7 වන මහල, 354/2, ඇල්විටිගල මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව

2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

	2020/2021	2019/2020
	රු. ශත	රු. ශත
සටහන 03		
ආදායම		
විවෘත වැඩසටහන් ආදායම	11,755,825.00	33,751,950.00
අභිරුචි කළ වැඩසටහන් ආදායම	4,748,778.50	17,841,010.00
අධ්‍යන පුහුණු පාඨමාලා	-	3,191,000.00
ජාත්‍යන්තර වැඩසටහන් ආදායම	-	14,700,000.00
වෙනත් විකුණුම්	-	122,000.00
රාජ්‍ය පෞද්ගලික හවුල් වැඩසටහන් ආදායම	328,584.00	-
	16,833,187.50	**69,605,960.00**
සටහන 04		
විකුණුම් පිරිවැය		
ඒ/කළා ආරම්භක තොග	658,347.60	662,755.72
ප්‍රචාරණ - වැඩසටහන්	-	292,814.00
සම්පත් දායක ගාස්තු - විවෘත වැඩසටහන්	1,496,650.00	3,528,270.00
සම්පත් දායක ගාස්තු - අභිරුචි කළ වැඩසටහන්	1,347,130.00	2,751,550.00
සම්පත් දායක ගාස්තු - අධ්‍යන වැඩසටහන්	220,200.00	918,600.00
තැපැල් ගාස්තු - වැඩසටහන්	189,360.00	600,618.00
වැඩසටහන්වලට අදාල පිරිවැය	378,061.51	1,484,915.00
ප්‍රවාහන සහ දෛනික සංයුක්ත දීමනා- වැඩසටහන්	27,411.00	137,429.00
ශාලා ගාස්තු	54,500.00	736,179.78
සංග්‍රහ - විවෘත වැඩසටහන්	1,471,515.00	4,753,690.00
සංග්‍රහ - අභිරුචි කළ වැඩසටහන්	249,680.00	1,641,310.00
සංග්‍රහ - අධ්‍යන වැඩසටහන්	3,600.00	290,900.00
ලිපිද්‍රව්‍ය සහ මුද්‍රණ - අභිරුචි කළ වැඩසටහන්		45,850.00
ඉන්ධන - වැඩසටහන්	85,300.00	104,800.00
OBT - වැඩසටහන් වියදම්	-	1,536,652.00
CSR - - වැඩසටහන් වියදම්	-	12,500.00
සංයුක්ත දීමනා	451,750.00	1,148,700.00
ජාත්‍යන්තර වැඩසටහන් වියදම්	-	13,005,456.66
රාජ්‍ය පෞද්ගලික හවුල් වැඩසටහන් වියදම්	202,760.00	
SME ව්‍යාපෘති වියදම්	36,133.00	
අ/කළා - අවසාන තොග	(640,354.73)	(658,347.60)
	6,232,043.38	**32,994,642.56**

සටහන 05

අනෙකුත් ආදායම්

උපදේශන සහ අනෙකුත් ආදායම්	-	2,500.00
	-	2,500.00

සටහන 06

පරිපාලන සහ ආයතනික වියදම්

වැටුප් සහ වේතන	17,129,484.27	17,015,542.55
සභාපතිගේ දීමනා	1,302,600.00	1,108,684.52
සභාපතිගේ වාහන දීමනා	-	250,000.00
සභාපතිගේ සංග්‍රහ වියදම් දීමනා	60,000.00	50,483.87
කළමණාකාර අධ්‍යක්ෂක දීමනා	-	1,065,027.42
විධායක අධ්‍යක්ෂ දීමනා	-	70,550.00
සේ.අ.අ.	2,025,394.90	1,972,157.80
සේ.හා.අ.	506,348.72	501,984.66
අතිකාල	293,901.00	610,286.00
කාර්යමණ්ඩල සුභසාධනය	420,702.00	772,296.00
කාර්යමණ්ඩල වාහන සහ අනෙකුත් දීමනා	1,722,480.00	1,675,460.00
පාරිතෝෂික	708,940.58	706,397.00
සේවක දිරිදීමනා	-	2,266,500.00
ක්ෂය		
ලීබඩු සහ උපකරණ	256,795.61	251,090.85
කාර්යාල උපකරණ	829,850.63	801,594.49
පරිගණක උපකරණ	874,780.17	979,902.15
නව කාර්යාල පරිශ්‍රය	794,794.80	796,972.32
වෙබ් පිටුව	169,550.39	124,898.88
ගිණුම්කරණ පැකේජය නඩත්තු කිරීම	659,629.20	658,236.00
විගණන ගාස්තු	234,050.50	272,980.00
නීති ලේකම් සේවා	138,860.88	200,299.89
තැපැල්	19,359.00	37,876.00
ලිපිද්‍රව්‍ය	1,279,845.80	2,098,470.50
මුද්‍රණ	489,115.00	640,302.00
දුරකථන	977,306.68	1,301,989.31
ප්‍රවාහන	243,719.00	613,378.77
ගිණුම්කරණ හා වෘත්තීය ගාස්තු	82,500.00	477,535.00
විදුලිය	742,099.82	981,721.53
ජලය	19,445.73	41,917.02
සනීපාරක්ෂක සේවා	591,067.71	531,617.64
රක්ෂණ - වාහන	141,211.10	160,958.46
ආරක්ෂක	1,189,976.44	1,526,071.48
කාර්යමණ්ඩල පුහුණු හා නඩත්තුව	145,200.00	548,532.80
ඉන්ධන	99,209.00	130,770.00
වාහන අළුත්වැඩියා සහ නඩත්තුව	404,824.00	286,917.00

නඩත්තු වියදම්	314,202.05	780,285.00
කාර්යාල උපකරණ නඩත්තු වියදම්	85,040.00	189,650.20
වායුසමීකරණ යන්ත්‍ර අළුත්වැඩියාව සහ නඩත්තුව	116,964.00	294,146.13
අධ්‍යක්ෂ මණ්ඩල පැමිණීමේ දීමනා	120,000.00	87,500.00
අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රවාහන දීමනා	40,000.00	62,500.00
විගණන හා කළමනාකරණ කමිටු දීමනා	-	90,000.00
අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංග්‍රහ වියදම්	39,170.00	58,467.00
පරිගණක නඩත්තු වියදම්	700.00	226,240.00
වාහන කුලී වියදම්	2,246,400.00	755,600.00
පරිත්‍යාග	-	35,000.00
පුවත්පත් හා වාර සඟරා	77,675.00	77,170.00
උත්සව සහ අවස්ථා වියදම්	24,265.00	201,043.00
බැංකු ගාස්තු	40,965.00	85,454.95
වෙබ් පිටුව නඩත්තු වියදම්	50,820.80	32,840.00
කමිටු රැස්වීම් වියදම්	-	117,000.00
PAYE	-	135,667.00
VAT	-	35,000.00
වරිපණම් බදු	75,600.00	-
ප්‍රචාරණය	-	69,250.50
රක්ෂණ	143,500.00	75,500.00
විද්‍යුත් තැපැල් හා අන්තර්ජාල ගාස්තු	-	19,440.00
ස්ථාවර වත්කම් අපහරණ පාඩු	-	29,403.16
උපදේශන සහ අනෙකුත් වියදම්	79,000.00	40,000.00
වෛද්‍ය දීමනා - කාර්යමණ්ඩල	6,000.00	-
	38,013,344.78	**45,026,558.85**

<u>සටහන 07</u>

<u>ශුද්ධ මූල්‍ය ආදායම්</u>

පොලී ආදායම - සේවක ණය	85,460.50	107,663.00
පොලී ආදායම - ස්ථාවර තැන්පතු	9,077,256.48	13,755,607.41
පොලී ආදායම - ඇමතුම් තැන්පතු	217,550.72	412,164.93
	9,380,267.70	**14,275,435.34**

සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල
“නිපුණතා පියස” , 7 වන මහල, 354/2, ඇල්විටිගල මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව

2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

සටහන - 08

වත්කම	පුතිශතය	පිරිවැය								ලියා හළ අගය
		2020 අප්‍රේල් 01 දිනට ශේෂය	එකතු කිරීම්	මාරු කිරීම් / අපහරණය	2021 මාර්තු 31 දිනට ශේෂය	2020 අප්‍රේල් 01 දිනට ශේෂය	එකතු කිරීම්	මාරු කිරීම් / අපහරණය	2021 මාර්තු 31 දිනට ශේෂය	
		රු. ශත	රු. ශත	රු. ශත	රු. ශත	රු. ශත	රු. ශත	රු. ශත	රු. ශත	රු. ශත
ලීබඩු සහ උපකරණ	10%	3,070,882.56	73,455.00	-	3,144,337.56	2,007,210.46	256,795.61	-	2,264,006.07	880,331.49
අනෙකුත් කාර්යාල උපකරණ	20%	6,149,646.04	208,523.00	-	6,358,169.04	4,726,135.20	829,850.63	-	5,555,985.83	802,183.21
මෝටර් රථ	25%	11,253,125.00	-	1,153,125.00	10,100,000.00	11,253,125.00	-	1,153,125.00	10,100,000.00	-
පරිගණක උපකරණ	25%	5,952,726.33	-	-	5,952,726.33	4,504,736.19	874,780.17	-	5,379,516.36	573,209.97
නව කාර්යාල පරිශ්‍රය	10%	7,947,948.11	-	-	7,947,948.11	5,608,660.83	794,794.80	-	6,403,455.63	1,544,492.48
වෙබ් පිටුව	25%	832,789.40	-	-	832,789.40	263,649.12	169,550.39	-	433,199.51	399,589.89
		35,207,117.44	**281,978.00**	**1,153,125.00**	**34,335,970.44**	**28,363,516.80**	**2,925,771.60**	**1,153,125.00**	**30,136,163.40**	**4,199,807.04**

සටහන 09

ආයෝජන

ස්ථාවර තැන්පතු - ලංකා බැංකුව	14,765,097.74	13,897,430.80
ස්ථාවර තැන්පතු - මහජන බැංකුව	140,000,000.00	140,000,000.00
	154,765,097.74	**153,897,430.80**

සටහන 10

වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ

කලින් ගෙවූ රක්ෂණ	65,661.68	65,661.68
ලැබිය යුතු පොලී	1,371,841.34	2,304,558.65
ලැබිය යුතු WHT	1,315,549.29	1,315,549.29
සේවක ආපදා ණය	1,445,564.88	1,749,976.88
අත්තිකාරම්	187,840.23	229,940.23
වෙළෙඳ ණය ගැතියෝ	15,324,978.80	16,791,953.80
කලින් ගෙවූ කුලී - කාර්යාල පරිශ්‍රය	45,360.00	45,360.00
වැටුප් අත්තිකාරම්	10,000.00	14,000.00
	19,766,796.22	**22,517,000.53**

සටහන 11

මුදල් හා මුදල් සමාන දෑ

බැංකුවේ ඇති මුදල් - BOC-801	3,095,450.72	3,663,155.91
ඇමතුම් තැන්පතු	3,474,369.10	16,745,443.75
ලංකා බැංකුව - ගිණුම් අංක 764148708	161,076.00	161,076.00
අතැති මුදල්	72,579.00	82,775.00
	6,803,474.82	**20,652,450.66**

සටහන 12

ප්‍රකාශිත ප්‍රාග්ධනය

සම්පූර්ණයෙන් ගෙවා නිමි සාමාන්‍ය කොටස් සහ එක් රන් කොටසක්	102,001,520.00	102,001,520.00
	102,001,520.00	**102,001,520.00**

සටහන 13

විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	**2020/2021**	**2019/2020**
	රු. ශත	**රු. ශත**
වර්ෂය ආරම්භයේ පැවති ශේෂය	3,225,347.00	3,147,364.00
වර්ෂය තුල අය කිරීම	708,940.58	706,397.00
වර්ෂය තුල ගෙවීම්/ ගෙවිය යුතු ගිණුමට මාරු කිරීම්	(492,217.50)	(130,235.00)
නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් වල වර්තමාන අගයේ ආයු ගණන (ලාභය)/අලාභය	216,580.74	(498,179.00)
වර්ෂය අවසාන ශේෂය	**3,658,650.82**	**3,225,347.00**

2021.03.31 දිනට සමාගමේ සේවකයන් සම්බන්ධයෙන් පාරිතෝෂික වගකීම් පිළිබඳ ආයු ගණන තක්සේරුව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (LKAS 19) අනුව සිදු කර ඇත. වර්ෂය තුළ රු.708,940.58 ක් වර්තමාන සේවා පිරිවැය හා පොලී පිරිවැය ලෙස හඳුනාගෙන ඇත.

සමාගම අඛණ්ඩ පැවැත්මකින් ඉදිරියට පවතිනු ඇත. පාරිතෝෂික වගකීම බාහිරව අරමුදල් සපයන්නක් නොවේ.

සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල

“නිපුණතා පියස” , 7 වන මහල, 354/2, ඇල්විටිගල මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව

2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

12.1 රන් කොටස් හිමියා

රන් කොටස් හිමියා යන්න දැනට භාණ්ඩාගාර ලේකම් විසින් දරනු ලබන අතර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් ඔහුගේ නමින් නොව භාණ්ඩාගාර ලේකම්වරයා විසින් හෝ ඔහුගේ නිල මට්ටමින් "පත් කරන ලද අධ්‍යක්ෂවරයෙකු" විසින් පමණක් දරනු ලැබේ. .

සාමාන්‍ය සාමාන්‍ය කොටස් හිමියාගේ අයිතිවාසිකම්වලට අමතරව රන් කොටස් හිමියාට පහත විශේෂ අයිතිවාසිකම් ඇත.

12.1.1 "රන් කොටස්" හිමිකරුට මහා සභා රැස්වීම විසින් සම්මත කරන ලද ඕනෑම සාමාන්‍ය, විශේෂ හෝ අතිවිශේෂ යෝජනා නිෂේධනය කළ හැකිය හෝ වෙනත් ආකාරයකින්, එවැනි යෝජනා, දැනට රන් කොටස් හිමියාගේ මතය අනුව, එක්කෝ සමාගමේ මෙහෙවර, ඉලක්ක සහ අරමුණු සඳහා පටහැනි හෝ රජයේ ප්‍රතිපත්තියට අනුකූල නොවිය හැක.

12.1.2 මුලින් සකස් කර සමාගමේ ව්‍යවස්ථාවලිය රන් කොටසෙහි හිමිකරුගේ එකඟතාවය මත "විශේෂ තීරණය" මගින් වරින් වර වෙනස් කළ හැකි අතර, "රන් කොටස්" සහ "රන් කොටස් හිමියා" යන වචනවල නිර්වචනය සහ රන් කොටස් හිමියාගේ අයිතිවාසිකම්වලට අදාළ ඕනෑම වගන්තියක් සංශෝධනය කිරීමට ලිඛිතව දැක්විය යුතුය.

12.1.3 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍යයට උනන්දුවක් දක්වන සමාගමේ කරුණු සාකච්ඡා කිරීමට රන් කොටස් හිමියාට හෝ ඔහුගේ නම් කරන්නන්ට හමුවීමට අවශ්‍ය නම්, සෑම මාස තුනකට වරක් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය ඇමතීමට රන් කොටස් හිමියාට හිමිකම් ඇත.

12.1.4 රන් කොටස් හිමියාගේ ලිඛිතව ලබා දී ඇති එකඟතාවයෙන් සහ කොටස් හිමියන්ගෙන් බහුතරයකගේ එකඟතාවයෙන් රන් කොටස් හිමියා සාමාන්‍ය කොටසකට පරිවර්තනය කළ හැකිය.

12.1.5 සමාගමට සති දෙකක ලිඛිත දැනුම් දීමකින් පසු සමාගමේ ගිණුම් පොත් පරීක්ෂා කිරීමට රන් කොටස් හිමියාට සහ/හෝ ඔහුගේ නම් කළ අයට හිමිකම් ඇත.

12.1.6 සමාගම විසින් සෑම කාර්තුවක් අවසානයේම දින 60ක් ඇතුළත, එම කාර්තුව තුළ සමාගමේ කාර්ය සාධනය සම්බන්ධ කාර්තුමය වාර්තාවක් රන් කොටස් හිමියාට සහ රන් කොටස් හිමියා සහ සමාගම විසින් එකඟ වූ පූර්ව නිශ්චිත ආකෘතියකින් ඉදිරිපත් කළ යුතුය.

12.1.7 සමාගම විසින් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේම දින 90ක් ඇතුළත, රන් කොටස් හිමියා සහ සමාගම විසින් එකඟ වූ පූර්ව නිශ්චිත ආකෘතියකින් සමාගමට අදාළ තොරතුරු රන් කොටස් හිමියාට ඉදිරිපත් කළ යුතුය.

සටහන 14

ආදායම් බදු

14.1 ප්‍රවර්තන වර්ෂයේ බදු

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතට අනුව සමාගම, ව්‍යාපාර බද්දෙන් ලැබෙන ලාභය සහ ආදායම පහත පරිදි වේ.

	2020/2021 රු. ශත	2019/2020 රු. ශත
ව්‍යවස්ථාපිත බදු අනුපාතය	**14%**	**14%**
ප්‍රවර්තන වර්ෂයේ ලාභය මත ආදායම් බදු (14.2)	-	-
තාවකාලික වෙනස්කම් වල ආරම්භය සහ ආපසු හැරවීම (සටහන 15)	(2,546,391.55)	5,522,486.81
	(2,546,391.55)	**5,522,486.81**

14.2 ගිණුම්ගත ලාභය ආදායම් බදු අතර සැසඳීම

	2020/2021 රු. ශත	2019/2020 රු. ශත
පොලී හා බදු වලට පෙර ගිණුම්ගත ලාභය /(අලාභය)	(27,412,201)	(8,412,741)
අනුමත නොකළ අයිතම වල එකතුව	3,694,712	3,775,743
එකතු කළා: තක්සේරු කළ හැකි ගාස්තු/ශේෂ දීමනාව	(1,834,991)	(1,784,106)
ව්‍යාපාරය මගින් ලද ගැලපුම් කළ ලාභය /(අලාභය)	-	13,200
	(25,552,480)	**(6,407,905)**
අනෙකුත් මූලාශ්‍ර මගින් ලද ආදායම (පොලී ආදායම)	9,380,268	14,275,435
මුළු ව්‍යවස්ථාපිත ආදායම / පාඩුව	**9,380,268**	**14,275,435**
අයදුම් කරන ලද ව්‍යාපාර අලාභ	(9,380,268)	(14,275,435)
බදු අය කළ හැකි ආදායම් / (අලාභ)	**-**	**-**
සාමාන්‍ය ව්‍යාපාර කටයුතු මත බදු	**-**	**-**
අනෙකුත් ආදායම් මත බදු	**-**	**-**
වර්ෂයේ ලාභය මත ආදායම් බදු	**-**	**-**

සටහන 15
විලම්බිත බදු වත්කම්

	2020/2021 රු. ශත	2019/2020 රු. ශත
වර්ෂය ආරම්භක ශේෂය	842,700.21	6,607,452.28
විලම්බිත බදු සඳහා පෙර වර්ෂ ගැලපීම්	1,255,788.66	(242,265.26)
	2,098,488.87	**6,365,187.02**
තාවකාලික වෙනස්කම් වල ආරම්භය සහ ආපසු හැරවීම	2,546,391.55	(5,522,486.81)
වර්ෂය අවසාන ශේෂය	**4,644,880.42**	**842,700.21**

බදු වගකීම්වලට එරෙහිව බදු වත්කම් හිලව් කිරීමට නීත්‍යානුකූලව බලාත්මක කළ හැකි අයිතියක් ඇති විට සහ එම විලම්බිත ආදායම් බදු මූල්‍ය අධිකාරියට අදාල වන විට විලම්බිත ආදායම් බදු සහ වගකීම් හිලව් කරනු ලැබේ.

	2020/2021	2019/2020
	රු. ශත	රු. ශත
විලම්භීත බදු වත්කම්	4,967,283.99	2,856,708.26
විලම්භීත බදු වගකීම්	(322,403.58)	(2,014,008.05)
	4,644,880.42	**842,700.21**

	2020/2021		2019/2020	
	වත්කම්	වගකීම්	වත්කම්	වගකීම්
වගකීම් සඳහා වෙන්කිරීම්	-	322,403.58	-	2,014,008.05
වත්කම් සඳහා වෙන්කිරීම්	-	-	32,634.34	-
නිෂ්චිත ප්‍රතිලාභ වගකීම	512,211.11	-	451,548.58	-
භාවිතා නොකළ බදු බැර	4,455,072.88	-	2,190,963.24	-
ආදායම් බදු ආපසු ලැබීම්	-	-	181,562.11	-
	4,967,283.99	**322,403.58**	**2,856,708.26**	**2,014,008.05**
ශුද්ධ විලම්භීත බදු	**4,644,880.42**	**-**	**842,700.21**	**-**

සටහන 16
නිපුණතා සංවර්ධන අර්ථසාධක අරමුදල

	2021.03.31	2020.03.31
	රු. ශත	රු. ශත
ගෙවිය යුතු ශිෂ්‍යත්ව අරමුදල	4,873,197.75	4,575,061.99
	4,873,197.75	**4,575,061.99**

සටහන 17	2020/2021	2019/2020
වෙළඳා සහ අනෙකුත් ගෙවිය යුතු දෑ	රු. ශත	රු. ශත
ගෙවිය යුතු විගණන ගාස්තු	420,090.00	578,299.50
ගෙවිය යුත බිල් - ආරක්ෂක	92,406.01	99,779.13
ගෙවිය යුත බිල් - විදුලිය	151,693.62	317,646.69
ගෙවිය යුත බිල් - ජලය	8,302.08	17,863.26
ගෙවිය යුත බිල් - ලේකම්	113,413.00	24,633.12
ගෙවිය යුත බිල් - සනීපාරක්ෂක	31,714.20	52,847.54
ගෙවිය යුත බිල් - අතිකාල/ සංයුක්ත හා දුම්රිය වාර ප්‍රවේශපත්‍ර	408,261.00	408,261.00
ගෙවිය යුත බිල් - සංග්‍රහ	407,187.00	407,187.00
ගෙවිය යුත බිල් - සම්පත්දායක ගාස්තු	413,550.00	413,550.00
ගෙවිය යුත බිල් - දුරකථන	147,377.83	252,802.30
ගෙවිය යුත බිල් - පුවත්පත්	-	17,015.00
ගෙවිය යුත බිල් - ගිණුම්කරණ පැකේජ නඩත්තුව	-	142,500.00

මාස 6 ඉක්මවූ ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් (801)	587,978.82	587,678.82
වෙළෙඳ ණයහිමියෝ	74,000.00	114,000.00
ගෙවිය යුතු සේ.අ.අ.	1,012.57	1,012.57
ගෙවිය යුතු පාරිතෝෂික	130,235.00	130,235.00
ගෙවිය යුතු වෙබ් පිටු	70,300.00	70,300.00
ආපසු ගෙවිය යුතු තැන්පතු	3,000.00	3,000.00
හදුනානොගත් තැන්පතු	96,409.64	96,409.64
	3,156,930.77	**3,735,020.57**

සටහන 18

කොටසක ඉපයීම

කොටසකට ඉපැයීම් ගණනය කිරීම පදනම් වී ඇත්තේ වර්ෂය සඳහා සාමාන්‍ය කොටස් හිමියන්ට ආරෝපණය කළ හැකි ලාභය වසර අවසානයේ ඇති සාමාන්‍ය කොටස්වල බරිත කළ සාමාන්‍ය සංඛ්‍යාවෙන් බෙදීම මතය.

18.01 කොටසක මූලික ඉපයීම

	2020/2021	2019/2020
	රු. ශත	රු. ශත
සාමාන්‍ය කොටස් හිමියන්ට ආරෝපණය කළ හැකි ලාභය	(15,702,122.15)	838,386.12
බරිත කළ සාමාන්‍ය කොටස් සංඛ්‍යාව	10,200,152.00	10,200,152.00
කොටසක ඉපයීම/ (අලාභය)	**(1.54)**	**0.08**

සටහන 19

ප්‍රාග්ධන බැඳීම්

වාර්තා කරන දිනය වන විට සමාගමට කිසිදු ප්‍රමාණාත්මක ප්‍රාග්ධන බැඳීමක් නොතිබුණි.

සටහන 20

වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය වන කිසිදු ප්‍රමාණාත්මක සිදුවීම් වාර්තා කළ දිනට පසුව සිදු නොවීය.

සටහන 21

මූල්‍ය අවදානම් කළමනාකරණය

දළ විශ්ලේෂණය

මූල්‍ය උපකරණ භාවිතය හේතුවෙන් සමාගම පහත අවදානම්වලට නිරාවරණය වී ඇත:

* ණය අවදානම

* ද්‍රවශීලතා අවදානම

ඉහත එක් එක් අවදානම් වලට සමාගම නිරාවරණය වීම, සමාගමේ අරමුණු, අවදානම මැනීම සහ කළමනාකරණය කිරීම සඳහා වන ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි පිළිබඳ ගුණාත්මක හා ප්‍රමාණාත්මක තොරතුරු මෙම සටහනෙන් ඉදිරිපත් කෙරේ.

අවදානම් කළමනාකරණ රාමුව

සමාගමේ අවදානම් කළමනාකරණ රාමුව ස්ථාපිත කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සම්පූර්ණ වගකීම පවතී. සමාගමේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති ස්ථාපිත කර ඇත්තේ සමාගම මුහුණ දෙන අවදානම හඳුනා ගැනීමට සහ විශ්ලේෂණය කිරීමට, සුදුසු අවදානම් සීමාවන් සහ පාලනයන් සැකසීමට සහ අවදානම් සහ සීමාවන්ට අනුකූල වීම නිරීක්ෂණය කිරීමට ය. වෙළඳපල තත්ත්වයන් සහ සමාගමේ ක්‍රියාකාරකම්වල වෙනස්කම් පිළිබිඹු කිරීම සඳහා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ පද්ධති නිරන්තරයෙන් සමාලෝචනය කෙරේ.

ණය අවදානම

ණය අවදානම යනු ගනුදෙනුකරුවෙකු හෝ මූල්‍ය උපකරණයකට ප්‍රතිවිරුද්ධ පාර්ශ්වයක් එහි ගිවිසුම්ගත බැඳීම් ඉටු කිරීමට අපොහොසත් වුවහොත් සහ ප්‍රධාන වශයෙන් පාරිභෝගිකයින් සහ ආයෝජන සුරැකුම්පත් වෙතින් සමාගමට ලැබිය යුතු මුදල් වලින් පැන නගින මූල්‍ය අලාභයයි. මූල්‍ය වත්කම් වල ධාරන අගය මගින් උපරිම ණය නිරාවරණය නියෝජනය කරයි. වාර්තා කරන දිනයේදී ණය අවදානමට උපරිම නිරාවරණය පහත පරිදි විය.

ණය සහ ලැබිය යුතු දෑ

	2021.03.31	2020.03.31
	රු. ශත	රු. ශත
වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ	21,063,668.40	23,813,872.71
ආයෝජන	154,765,097.74	153,897,430.80
මුදල් හා මුදල් සමාන දෑ	6,803,474.82	20,652,450.66
	182,632,240.96	**198,363,754.17**

ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කම් ලබා දීමෙන් පියවා ගන්නා මූල්‍ය වගකීම් හා සම්බන්ධ බැඳීම් සපුරාලීමේදී සමාගමට දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදුවන අවදානමයි. මෙම අවදානම කළමනාකරණය කිරීම සඳහා සමාගමේ ප්‍රවේශය නම්, හැකිතාක් දුරට, සාමාන්‍ය හෝ ආතති තත්ත්වයන් යටතේ, සමාගමේ කීර්ති නාමයට හානියක් නොවන පරිදි පිළිගත නොහැකි පාඩු හෝ ඇතිවන විට, එහි වගකීම් සපුරාලීමට ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් ඇති බව සහතික කිරීමයි.

ද්‍රවශීලතා අවදානම මැනීම සහ අවම කිරීම සඳහා, සමාගම සිය ශුද්ධ මෙහෙයුම් මුදල් ප්‍රවාහය සමීපව නිරීක්ෂණය කළ අතර, මුදල් හා මුදල් සමාන දෑ අවශ්‍ය මට්ටමක පවත්වා ගෙන ගිය අතර මූල්‍ය ආයතනවලින් කැපවූ අරමුදල් පහසුකම් සුරක්ෂිත කරන ලදී.

ව්‍යුත්පන්න නොවන මූල්‍ය වගකීම්

	2020/2021	2019/2020
	රු. ශත	රු. ශත

වෙළෙඳ හා වෙනත් ගෙවිය යුතු දෑ	3,156,930.77	3,735,020.57
	3,156,930.77	**3,735,020.57**

සටහන 22

දේපළ, පිරියත හා උපකරණ අපහරණය

COVID-19 තත්ත්වය යටතේ, සමාගම 2021 මාර්තු 31 වන දිනට අපහරණය කළ යුතු දේපළ, පිරියත සහ උපකරණ හඳුනාගෙන නොමැත.

කෙසේ වෙතත්, අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට (අංක 119) අනුව, සමාගම විසින් (අපහරණය කළ හැකි/භාවිතා නොකළ) අංක 302-1353 දරන මෝටර් රථය ශ්‍රී ලංකාවේ වෘත්තීය පුහුණු අධිකාරියේ ශිෂ්‍ය පුහුණුව භාවිතා කිරීමට නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය වෙත පවරන ලදී.

සටහන 23

සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

මූල්‍ය ප්‍රකාශන මගින් ආවරණය කරන ලද කාලසීමාවන් තුළ සමාගම සම්බන්ධ පාර්ශවීය ගනුදෙනු සිදු කර ඇත. ඉහළ කළමනාකරණයට කළ ගෙවීම් පහත පරිදි වේ.

	2020/2021 **රු. ශත**
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික පැමිණීමේ දීමනා	120,000.00
අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රවාහන දීමනා	40,000.00
	160,000.00

සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදලේ **2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදලේ **("සමාගම")** 2021 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

සමාගමේ 2021 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සමාගමේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමාගමේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමාගමේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

1.5 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්

ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) (ඈ) වගන්තියේ සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා වෙත ලබාගන්නා ලදී. මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 සමාගමේ මුල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියේ අවශ්‍යතාවයට අනුකූල වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව **<<** ***පහත සඳහන් නිරීක්ෂණ හැර*** යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	***නිරීක්ෂණ***
(අ) 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5 වගන්තිය	සෑම මුදල් වර්ෂයක්ම අවසන් වී දින 150ක් ඇතුළත වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. කෙසේ වෙතත්,

	2014/2015 සිට 2020/2021 දක්වා වාර්ෂික වාර්තා 2021 නොවැම්බර් 30 දින දක්වාම සභාගත කර නොතිබුණි.
(ආ) 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය	අවම වශයෙන් මාස 03 කට වරක්වත් විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතු වුවත්, සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුළ විගණන කමිටු පැවැත්වීමට අපොහොසත් වී තිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සමාගමේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

රාජ්‍ය - පුද්ගලික හවුල් වැඩසටහන් ලෙස සමාගම 2019 සහ 2020 දී පුද්ගලික අංශය සමඟ අවබෝධතා ගිවිසුම් 11 කට එළැඹ තිබුණි. 2021 ජූලි 31 වන විට සක්‍රිය වූ වැඩසටහන් 08 න් සාංගමික ව්‍යවස්ථාවලියේ අරමුණුවලට පටහැනිව සමාගමේ ලාංඡනය භාවිතා කිරීමට සමාගම් හතරකට අවසර දී තිබුණි.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති